# ශ්‍රී ලංකාවේ වැඩ කරන දුප්පතුන්ට එරෙහිව ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉලක්කගත කතිකාවත

සඳුදා, 2023 මැයි 08,  00:55



*විශාල ජන කණ්ඩායම් තවදුරටත් බැහැර කර විරසක කරවන,  දුප්පතුන් තක්සේරු කිරීම සඳහා අනුගමනය කරන තාක්ෂණික ක්‍රමවේදය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන් අතර අනතුරු ඇඟවීමේ සීනු නැංවිය යුතුය.*

---

***ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී එකමුතුව විසිනි***

---

ආර්ථික අර්බුදය සහ ඇඩි අරපිරිමැස්ම සඳහා ගන්නා කප්පාදු පියවර සඳහා නැඹුරු වූ,  ප්‍රතිසාධන වැඩසටහනක් විසින් ශ්‍රී ලංකාවේ වැඩ කරන දුප්පතුන්ගේ ජීවිත විනාශ කර ඇත. ලෝක බැංකුවේ සහ ජා.මූ.අ (IMF) නිර්දේශිත ඉලක්කගත සමාජ ආරක්ෂණ දැල් වැඩසටහනේ අප්‍රමාණවත් බව පිළිබඳව විවේචකයින්ගේ  සැළකිල්ල යොමුවෙද්දී , දුප්පතුන් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ඇති අය"සත්‍යාපනය කිරීමේ" ක්‍රියාවලිය සමාප්ත වී  ඇත.

මෙම ක්‍රියාවලිය අපගේ අසල්වැසි ප්‍රදේශවල ක්‍රියාත්මක වන විට, ආර්ථික අර්බුදයෙන් දැනටමත් දැඩි ලෙස පීඩාවට පත් වූ පුද්ගලයින් ආගන්තුක බහු මාධ්‍ය ලේඛනගතකිරීම්  සහ දිගු ප්‍රශ්නාවලි විසින් පරිපාලනය කිරීම දෙස  අපි වැඩෙන භීතියෙන් යුතුව බලා සිටියෙමු. එම ක්‍රියාවලිය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම සඳහා ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී එකමුතුව විසින් සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ඇතුළත් ව,  යාපනය, මඩකලපුව, කොළඹ සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක හතරක පර්යේෂණ සිදු කරන ලද අතර තේරීම් ක්‍රියාවලිය පිළිබඳ අපි අපගේ අදහස් කිහිපයක් පහතින් බෙදා ගනිමු.

## 1010101010 සත්‍යාපන ක්‍රියාවලිය

සත්‍යාපන ක්‍රියාවලියට පුළුල් මාර්ගගත ප්‍රශ්නාවලියක් ඇතුළත් විය. නිවසේ සාමාජිකයින්ගේ ඡායාරූප, නිවාස, වත්කම් සහ ලේඛන ද සටහන් කරගෙන ඇත. සමීක්ෂණයට ලක් වූ සෑම පුද්ගලයෙකුටම QR කේතයක් ලබා දී ඇති අතර අස්වැසුම නම් ඩිජිටල් යෙදුමක් හරහා දත්ත රැස් කරනු ලැබේ. එය තාක්‍ෂණිකව කාර්යක්ෂම ක්‍රියාවලියක් බව රජය කියා සිටි අතර, තම නිවෙස් වෙත පැමිණෙන දිනයන් පිළිබඳව  එක් එක් පුද්ගලයා කෙටි පණිවුඩයක් මගින් දැනුවත්වීමක් ලබා ගත යුතු බව රජය කියා සිටියේය. අනුගණකයන් පැමිණි අවස්ථාවේ නිවසේ නොසිටි අය, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන කෙරෙහි උනන්දුවක් නොදක්වන අය ලෙස සලකනු ලැබීය.

යථාර්ථය නම්, මිනිසුන් රැකියාවට නොගොස් නිවෙස්වල පැය ගණන් දින ගණන් බලා සිටියේ තමා ව ඉවත් කරනු ඇතැයි යන බියෙනි. කාර්යය භාර දී තිබූ  ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය,  පැය ගණනක් පැවති සම්මුඛ පරීක්ෂණ හරහා කාර්යය සපුරා ගැනීමට සහ ඔවුන්ට වෙන් කර ඇති නිවාස සංඛ්‍යාව ආවරණය කිරීමට අරගල කිරීම නිසා බොහෝ ප්‍රමාදයන් සිදු විය. රැකියා සඳහා වෙනත් දිස්ත්‍රික්කවලට යන මිනිසුන්ට නියමිත වේලාවට ආපසු ගෙදර යාමට නොහැකි වූ අතර ඔවුන් එලදායී ලෙස පද්ධතියෙන් පිටතට තල්ලු කරන ලදී. එක් අවස්ථාවකදී ඇඳේ සිටි වයෝවෘද්ධ කාන්තාවක් මන්නාරමේ පිහිටි තම පුතාගේ නිවසට පදිංචියට ගොස් ඇති අතර මඩකලපුවේ ඇගේ ලියාපදිංචි ලිපිනයට ආපසු යාමට තරම් හැකියාවක් නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඇය "සත්‍යාපනය" නොකෙරුණු අතර, ඇයගේ QR කේතය නිකුත් නොකළ අතර ඇයව  සමාජ ආරක්ෂණ ජාලයේ වැඩසටහනෙන් බොහෝ විට ඉවත් කරනු ඇත.

අනුගමනය කරන ලද සත්‍යාපන ක්‍රියාවලිය කාර්යක්‍ෂම වූවක් මිස එය විශ්වාස කටයුතු නොවන බව පැහැදිලිය. තවද, භාවිතා කරන නිර්ණායක, දර්ශක සහ ගණනය කිරීමේ ක්‍රමය ශ්‍රී ලංකාව තුළ දැනට අත්විඳින දරිද්‍රතාවයේ සන්දර්භය සහ මානයන් සමඟ නොගැලපෙන සහ නිරර්ථක වන බවක් පෙනේ. නිදසුනක් වශයෙන්, කුටුම්භවලින් තුනෙන් එකක් ආහාර අනාරක්ෂිතතාවයට මුහුණ දෙන අතර මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් වැඩි වී ඇති හෙයින්, ආහාර සුරක්ෂිතතාව සහ මූලික පෝෂණ අවශ්‍යතා සපුරාලීමේ හැකියාව පිළිබඳ පියවරයන්ට ප්‍රමුඛත්වය ලබා දීමට අපොහොසත් වීම තුළින් ආර්ථික අර්බුදය හා ප්‍රතිසාධන වැඩසටහන  නිසා ඇති වූ විනාශය පිළිබඳ ඇති අසංවේදී භාවය හෙළි කරයි.

අධ්‍යාපනය, සෞඛ්‍යය, ආර්ථික මට්ටම, වත්කම්, නිවාස තත්ත්වය සහ පවුල් ජන විකාශනය ඇතුළු නිර්ණායක සහ 1 සහ 0 ලකුණු ක්‍රමයක්,  සමාජ ආරක්ෂණ දැල් සඳහා සුදුසුකම් මැනීමට භාවිතා කෙරේ. එක් එක් පුද්ගලයා සඳහා අවසාන ලකුණු සහ කඩඉම් ලකුණු තීරණය කිරීම සඳහා දර්ශක විසින් ලබා දී ඇති බර තීරණය කරනු ලබන්නේ දිස්ත්‍රික් කෝටා මගිනි. භාවිතා කරන ලකුණු ක්‍රමයට අනුව, පවුලේ සාමාජිකයෙකුට ස්ථිර නිවසක්, පිරිසිදු පානීය ජලය සහ වැසිකිළි පහසුකම්, යතුරුපැදියක් සහ පශු සම්පත් තිබේ නම්, නිවසක් දුප්පත් යැයි නොසැලකේ. දිගුකාලීන නිදන්ගත රෝග හෝ ආබාධ සහිත රෝගීන් නොමැති පවුල්, පාසල් හැර ගිය දරුවන් හෝ තනි මාපියන් සහිත පවුලක නොවන දරුවන් "දුප්පත් නොවන" ලෙස සලකනු ලැබේ. අක්කර එකකට වඩා වැඩි කෘෂිකාර්මික ඉඩම් ඇති කුටුම්භ, ට්‍රැක්ටරයක හෝ ධීවර බෝට්ටුවක හිමිකාරිත්වය සහිත වීම ‘‘දුප්පත් නොවන ’’ ලෙස වර්ගීකරණය කිරීම වැනි නිර්ණායක විසින්  ගොවීන් සහ ධීවරයන් දරිද්‍රතාවයට ඇද දමා ඇති තත්ත්වයන් පිළිබඳ ඇති අවබෝධයේ ඌනතාව තවදුරටත් හෙළිදරව් කරයි.

ආර්ථික අර්බුදය හේතුවෙන් සංක්‍රමණය වැඩි වීම තුළ, නිවසේ සිටින සංක්‍රමණික සේවකයෙකු රාජ්‍ය ආධාර ලබාදීමෙන් ඉවත් කිරීමට ප්‍රමාණවත් යැයි සැලකේ. යුද්ධයේදී තුවාල ලැබූ කෘත්‍රිම පාදයක් සහිතව ජීවත් වූ කාන්තාවකගේ සැමියාට මෙරටින් රැකියාවක් සොයා ගැනීමට නොහැකි නිසා විදේශගත වීම වෙනුවෙන් ණයක් ගැනීමට සිදු වූ විට, ලැයිස්තුවෙන් ඉවත් කරන ලදී. එම ආබාධිත කාන්තාව - දැන් ණය බර වී සිටින අතර, ඇගේ ස්වාමිපුරුෂයාගෙන් තවමත් ආදායමක් ද ලැබී නැත - රජය නිකුත් කරන ලද සමාජ ආරක්ෂණය ද නොලැබේ. අර්බුදයෙන් බේරීමට මංමුලා සහගත ප්‍රයත්න දරන්නන්ට සහය දෙනවා වෙනුවට රාජ්‍යය කරන්නේ සහයෝගය ඉවත් කිරීම මගින් ඔවුන්ට දඬුවම් කිරීමයි.ජාත්‍යන්තර කම්කරු සංවිධානය, පැහැදිළිව ප්‍රකාශ කරන පරිදි සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ඇතැම් ජීවිත අවදානම් සහ සමාජ අවශ්‍යතාවලින් ආරක්ෂා වීමේ විශ්වීය අවශ්‍යතාවය ලෙස සැලකිය යුත්තේ මන්ද යන්න සහ ආදායම් ප්‍රවාහයට නොවැළැක්විය හැකි බාධාවන් එල්ල වීම පෙන්වා දෙන නිසා අපි ඇගේ සිදුවීම බෙදාගන්නෙමු. ඊට පටහැනිව සිදුවන , ලෝක බැංකුව සහ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ ඒකීය අවධානය හිමිවන "දුප්පතුන් හඳුනා ගැනීම" කෙරෙහි සමාජ ආරක්ෂණයේ ඇති අර්ථය අභාවයට යවයි.

පද්ධතියේ කලින් කොටසක් බවට පත් වූ වූ බොහෝ දෙනෙක් සත්‍යාපන ක්‍රියාවලියේ "පහර දීම හෝ මග හැරීම" ප්‍රවේශය සමඟින් පිටතට තල්ලු කරනු ලැබේ. නිදසුනක් වශයෙන්, ආබාධ සහිත පුද්ගලයන් දහස් ගණනක් ආබාධිත සුබසාධන යෝජනා ක්‍රමය සඳහා වසර ගණනාවක් පොරොත්තු ලේඛනවල සිටින සන්දර්භයක් තුළ මෙවැනි අඩුපාඩු සිදු වීමට හැකිය. සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලියට සහභාගී වූ ජනතාව දුර්වල වන ආර්ථික අර්බුදය මධ්‍යයේ වඩාත්ම අවදානමට ලක්ව ඇති විට ඔවුන් විසින් මෙම ව්‍යායාමය සමාජ ආරක්ෂණ ප්‍රතිපාදන අඩු කිරීමේ දුෂ්ට පියවරක් ලෙස සැලකීම පුදුමයක් නොවේ.

ලෝක බැංකුව සහ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රමවේදය මගින් දරිද්‍රතාවයේ වඩාත් පැහැදිලි ආකාරයන් පවා හඳුනා ගැනීමට අපොහොසත් වන අතර, ආර්ථික අනාරක්ෂිතභාවයට තුඩු දෙන බහුවිධ, ස්ථර සහ සංකීර්ණ මානයන් අත්හැර දමයි. එය ආර්ථික අර්බුදයක් නිසා මිනිසුන් අත්විඳින විශේෂිත බැහැර කිරීම් ආමන්ත්‍රණය කිරීමෙන් බොහෝ දුරස් වී ඇත. මෙම ක්‍රියාවලිය තුළින් රට පුරා දරිද්‍රතාවයේ අත්දැකීම්වල ඒකාකාරී බව උපකල්පනය කරයි. එය දරිද්‍රතාවයට සහ බැහැර කිරීමට බලපාන දේශපාලන ආර්ථිකය හෝ ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළු සමාජ ව්‍යුහයන් පිළිබඳ විශ්ලේෂණයකින් තොරය.

## තාක්‍ෂණික ප්‍රහාරය

ලෝක බැංකුව සහ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද සත්‍යාපන ක්‍රියාවලිය සාධාරණීකරණය කරනු ලැබුවේ "විශේෂඥයින්" විසින් වර්ධනය කරන ලද "වෛෂයික" ලක්ෂණ මත පදනම්ව දුප්පතුන් හඳුනාගැනීමේ "විද්‍යාත්මක ප්‍රවේශයක්" ක්‍රමවේදය හරහා අසාධාරණ ලෙස ප්‍රයෝජන ගැනීමට කැමති අයව ඉවත් කරනු ඇත යන පදනම මත ය. එවැනි තාක්‍ෂණික භාෂාවකින් අදහස් දැක්වීම , ශ්‍රී ලංකාවේ වැඩ කරන දුප්පතුන්ගේ ඒකාකෘතිකරණය සහ ද්වේෂ සහගත චරිත නිරූපණයන් සක්‍රිය කරන ක්‍රියාවලියක් වන අතර බලහත්කාරයෙන් හා අධික නිරීක්‍ෂණය කිරීමට සහ දත්ත රැස් කිරීමට මග පාදයි. "ඇත්තම කියමු ඇත්තම අයට ප්‍රතිලාභ දෙමු (අවංක වෙමු – සැබෑ අවශ්‍යතා ඇති අයට ප්‍රතිලාභ ලැබේවා)" යනුවෙන් නිර්ලජ්ජිතව නම් කර ඇති මෙම ක්‍රියාවලිය, වැඩ කරන දුප්පතුන් වංක, කම්මැලි සහ කුමන්ත්‍රණකාරී ලෙස හුවා දක්වයි. ශ්‍රී ලංකාවේ වැඩ කරන දුප්පතුන්ගෙන් බහුතරය කාන්තාවන් වන බැවින් , එවැනි සෘණාත්මක ප්‍රචාරයක මූලික ඉලක්කය වන්නේ කාන්තාවන් ය.

'කම්මැලි සහ වංචා කරන' දුප්පත් වැඩ කරන ජනතාව පිළිබඳ කතිකාව කොළඹ පදනම් වූ ප්‍රතිපත්ති සංසද අතර බහුලව දක්නට ලැබේ. 2023 අයවැය කතාවේදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ ප්‍රකාශ කළේ "අපි දවසින් දවස කම්මැලි වුණා. මිනිස්සු හැමදෙයක්ම රජයෙන් ගන්න පුරුදු වෙලා. මෙහිදී ඔහු සඳහන් කරන "අපි" යනු මේ රටේ දුප්පත් සහ වැඩ කරන ජනතාවයි. රාජ්‍ය නිලධාරීන් එම

ක්‍රියාවලියේදී ලෝක බැංකුවේ කාර්යභාරය ගැන ප්‍රශස්ති ගායනා කළහ. නිදසුනක් වශයෙන්, එක් සම්මුඛ සාකච්ඡාවකදී, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සාමාජිකයෙකු පැවසුවේ, "ලෝක බැංකුවේ සහාය ඇතිව සකස් කරන ලද සුදුසුකම් නිර්ණායක පදනම් වන්නේ කුටුම්භවල වෛෂයික සහ සත්‍යාපනය කළ හැකි ලක්ෂණ මත බව" සහ මෙම ක්‍රියාවලිය හරහා විවිධ සමාජ සුබසාධන වැඩසටහන් 31 ක් එක ක්‍රමයක් යටතේ ගෙන එන බවයි.

ප්‍රාදේශීය මට්ටමින්, රාජ්‍ය නිලධාරීන් එකම සාධාරණීකරණයන් පුනරුච්චාරණය කරමින් සිටින අතර සැම නිවසක්ම එක් යෝජනා ක්‍රමයක් සඳහා පමණක් සුදුසුකම් ලැබිය යුතු බවත්, නිවසේ පුද්ගලයන් බහුවිධ දුර්වලතා අත්විඳින විට පවා වැඩිහිටි දීමනාව, ආබාධිත දීමනාව සහ සමෘද්ධි දීමනාව නොලැබිය යුතු බවට තර්ක කළෝය. ඇත්ත වශයෙන්ම, බලවත් සහ මූලික සිද්ධීන් ඇති බොහෝ කුටුම්භ රජයේ කිසිදු යෝජනා ක්‍රමයක කොටසක් නොවේ. නාගරික දරිද්‍රතාවයේ බහුවිධ මානයන් පිළිබඳ අවබෝධයක් නොමැතිකම පෙන්නුම් කරමින් කොළඹ පදනම් වූ චින්තන තටාක ද උදොග්ගයෙන් යුතුව විදුලි පරිභෝජනය වැනි නව නිර්ණායක, අස්වැසුම නිර්ණායක මත වර්ධනය වෙමින් පවතින ලැයිස්තුවට එකතු කිරීමට යෝජනා කරයි. මේ අනුව, බහුවිධ ව්‍යසනවලින් ජාතියේ වැඩ කරන දුප්පතුන් සාගතයට තල්ලු කරන විට ඔවුන් ආරක්ෂා කරනවාට වඩා, ජා.මූ.අ. (IMF)සහ ලෝක බැංකුව දුප්පතුන්ට එරෙහිව වෛරී ප්‍රකාශ දිගටම කරගෙන යන අතර, රාජ්‍යය සහ ප්‍රභූන් ද මෙම කතිකාවට පූර්ණ එකඟතාවය පළ කරති.

## බෙදා පාලනය කිරීම

වසංගතයට ගොදුරු වූ 2021 වර්ෂය සහ අර්බුදකාරී වර්ෂ වන 2022 සහ 2023, දැඩි අරපිරිමැස්ම සඳහා ගන්නා කප්පාදු පියවරයන් ක්‍රියාත්මක කිරීම දැක තිබේ. සාමාන්‍ය ජනතාව විසින් දරනු ලබන එකතු කළ අගය මත බද්දෙහි වැඩිවීම, විදුලිය හා ජල සහනාධාර කප්පාදු කිරීම, ප්‍රවාහන, ඖෂධ, භූමිතෙල්, පොහොර, පළිබෝධනාශක සහ සත්ව ආහාරවල මිල ඉහළ යාම සහ මූලික ආහාර ද්‍රව්‍යවල ඝාතීය ලෙස සිදුවන වැඩිවීම් ශ්‍රී ලංකාවේ වත්මන් යථාර්ථය වේ. ඊට හාත්පසින්ම වෙනස්ව, බොහෝ අසංවිධානාත්මක අංශයේ රැකියා විශාල වශයෙන් කප්පාදු කිරීමේ සන්දර්භය තුළ බොහෝ වැඩ කරන දුප්පතුන් රැකියා සොයා ගැනීමට අරගල කරන අතරතුර දී පවා මූලික වැටුප්වල වර්ධකයන් ඇත්තේ නැත.

දකුණු ආසියාතික රටවල් අතුරින් සමාජ ආරක්ෂණය සඳහා අඩුම මුදල ශ්‍රී ලංකාව විසින් මෙම වසංගතය තුළ වැය කර ඇත. ජා.මූ.අ (IMF) වාර්තා කළේ 2022 දී සමාජ ආරක්ෂණ දැල් සඳහා වන වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.6% ක් පමණක් වන අතර එය 2023 දී ද පවත්වා ගෙන යනු ඇති බව ය. මේ අතර, පසුගිය වසර දෙක තුළ දරිද්‍රතා අනුපාතිකය දෙගුණයක් වී ඇති අතර අසමානතාවයන් පුළුල් වී ඇත. ලෝක බැංකුව ඇස්තමේන්තු කර ඇත්තේ දරිද්‍රතාවය, පූර්ව වසංගත අනුපාතය වූ 11.3% සිට 25.6% දක්වා 2022 දී වැඩි වී ඇති බවයි. පසුගිය වසර කිහිපය තුළ ආසන්න වශයෙන් මිලියන 5.6 ක ජනතාවක් හෝ ජනගහනයෙන් 23% ක් දරිද්‍රතාවයට වැටී ඇති අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් කාන්තාවන් වේ. නමුත් රාජ්‍ය අනුග්‍රහය ලබන පිරිස වැඩි වී නැත. සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම දැනට ළඟා වන්නේ මිලියන 2 කට වඩා අඩු පුද්ගලයින් හෝ ජනගහනයෙන් 9% කට ය. ලෝක බැංකුව සහ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය ප්‍රමුඛ සත්‍යාපන ක්‍රියාවලිය ආවරණය කරන්නේ පුද්ගලයන් මිලියන 3.7ක් හෝ ජනගහනයෙන් 14%ක් පමණක් වන අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ප්‍රතිලාභ ලැයිස්තුවෙන් ඉවත් කිරීමට උත්සාහ කරමින් සිටී.

2023 අප්‍රේල් 21 වැනි දින නිකුත් කරන ලද ගැසට් නිවේදනයකට (2328/131) අනුව, 2023 ජූලි 1 වැනිදා සිට අස්වැසුම ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පහත පරිදි ක්‍රියාත්මක කරන බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කර ඇත. ඒ පවුල්/පුද්ගලයින් 400,000කට 2023 දෙසැම්බර් 31 දක්වා මසකට රු. 2,500 ක් ද; පවුල්/පුද්ගලයින් 400,000කට 2024 මාර්තු 31 දක්වා මසකට රු. 5,000 ක් ද; පවුල්/පුද්ගලයින් 800,000කට 2023 ජූලි සිට වසර තුනක කාලයක් සඳහා මසකට රු. 8,500 ක් ද; සහ පවුල්/පුද්ගලයින් 400,000කට 2023 ජූලි මස සිට වසර තුනක කාලයක් සඳහා මසකට රු.15,000 ක් ද වන පරිදි ය. නිවසක පුද්ගලයන් දෙදෙනෙකු හෝ දෙදෙනෙකුට වඩා අඩු නම්, ඔවුන්ට වෙන්

කරන ලද මාසික ගෙවීමෙන් අඩක් ලැබෙනු ඇත. මෙම ගැසට් පත්‍රයට අනුව, උපරිම වශයෙන්, මෙම යෝජනා ක්‍රමය වසර අවසන් වන තෙක් මිලියන 2 ක ජනතාවකට පමණක් ළඟා වනු ඇති අතර එය 2024 දී නැවත පෙරළනවා ඇත.

මෙම සන්දර්භය තුළ, තාක්ෂණික ක්‍රියාවලියක් විසින් පවත්වාගෙන යනු ලබන දුප්පතුන් පිළිබඳ ද්වේෂ සහගත තර්කය විසින සිදුකරන්නේ වැඩ කරන දුප්පතුන්ව බෙදීම පමණක් ම නොව, ලැයිස්තුවේ සිටිය යුත්තේ කවුරුන්ද යන්න ගැන ගම් මට්ටමින් සටන් කිරීමත්, එකිනෙකා දැනුවත් කිරීමට සහ නිරීක්ෂණය කිරීමත් ය. දුප්පතුන්ගේ සෝදිසි කිරීම සිදු කෙරෙන්නේ ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වී තිබෙන ඔවුන්ගේ දුක් වේදනා සමනය කිරීමේ වගකීම රජය පැහැර හැරීම සම්බන්ධයෙන් පුලුල්ව පැතිරුනු අතෘප්තියක සන්දර්භය තුළ ය.

විශාල ජන කණ්ඩායම් තවදුරටත් බැහැර කර විරසක කරන, දුප්පතුන් තක්සේරු කිරීම සඳහා අනුගමනය කරන තාක්ෂණික ක්‍රමවේදය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන් අතර අනතුරු ඇඟවීමේ සීනු නැංවිය යුතු ය. එය ඉලක්කගත යෝජනා ක්‍රම සඳහා වන ප්‍රවේශය ආරක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ද්‍රෝහී යුක්තිසහගත කිරීම් කිසිවෙකු හෝ නොමඟ නොයවයි. මේ අනුව, ආර්ථික අර්බුදය මධ්‍යයේ ශ්‍රී ලාංකිකයන්ගේ දැවැන්ත දිළිඳුකමට විසඳුම් සෙවීමට ඉලක්කගත සමාජ ආරක්ෂණ ජාලයක් අත ළඟම අසාර්ථක වීමට අමතරව, වැඩ කරන දුප්පතුන් සහ කාන්තාවන් සම්බන්ධයෙන් පැන නගින ගැටලු සහගත කතිකාවන් පෙන්වා දෙන්නේ ඉදිරියට එන විශාල සමාජ ගැටුමක් පිළිබඳවය.

පාද සටහන:

http://documents.gov.lk/files/egz/2023/4/2328-13_E.pdf

---

*(ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී එකමුතුව යනු වත්මන් ආර්ථික හා දේශපාලන අර්බුදයට ප්‍රතිචාර දැක්වීම සඳහා විශ්ලේෂණය කිරීමට සහ යෝජනා ඉදිරිපත් කිරීමට එක් වූ ස්ත්‍රීවාදී ආර්ථික විද්‍යාඥයින්, විද්වතුන්, ක්‍රියාකාරීන්, විශ්වවිද්‍යාල සිසුන් සහ නීතිඥයින්ගේ එකතුවකි.)*